**කෑගල්ල නගර සභාව**

**කෑගල්ල දිස්ත්‍රික්කය**

---

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ජුලි 10 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.

1.2 <u>මතය</u>

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති කෑගල්ල නගර සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>.

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

(අ) රු. 4,667,983 ක් වූ ණයහිමියෝ අඩුවෙන් ගිණුම්ගත කිරීම නිසා ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2012 ජනවාරි 01 දිනට මුද්දර ගාස්තු ආදායම් ණයගැතියෝ රු. 6,260,540 ක් අඩුවෙන් ගිණුම්ගත කිරීම නිසා, 2012 දෙසැම්බර් 31 දිනට ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ස්ථාවර වත්කම් ලේඛණයේ ඇතුලත් රු. 833,463 ක් වූ මෝටර් රථ හා කරත්ත විෂයයන් 16 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබූ අතර ලේඛණයේ ඇතුලත් රු. 608,000 ක් වූ ට්‍රැක්ටර් රථ දෙකක වටිනාකම රු. 676,000 ක් ලෙස රු. 68,000 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි වැඩි දියුණු කිරීම සඳහා දරන ලද රු. 2,516,838 ක මුදල හා ස්ථාවර වත්කම් ලේඛණයේ ඇතුලත් ඉඩම් හා ගොඩනැගිලි 83 ක වටිනාකම ප්‍රාග්ධනිත නොකිරීම හේතුවෙන් ශේෂ පත්‍රයේ ඉඩම් ගොඩනැගිලි වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 <u>නොසැසඳුන පාලන ගිණුම්</u>

ගිණුම් විෂයයන් 12 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු. 154,923,462 ක් වූ අතර, උපයෝගී ලේඛන/වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 144,708,822 ක් වූයෙන් වෙනස රු. 10,214,640ක් විය.

1.3.3 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම.</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 9,200,138 ක් වූ ගණුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 23,342,929 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 29,124,729 ක් විය.

2.2 <u>ආදායම් පරිපාලනය</u>

2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්</u>

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) වරිපනම් හා බදු | 9,525 | 10,145 | (620) |
| (ii) බදු කුලී | 34,352 | 35,421 | (1,069) |
| (iii) බලපත්‍ර ගාස්තු | 779 | 1,326 | (547) |
| (iv) වෙනත් ආදායම් | 55,315 | 15,296 | 40,019 |

2.2.2 <u>මුද්දර ගාස්තු</u>

2012 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් රු. 2,117,398 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

2.3 <u>නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්</u>

රු. 648,000 ක් වූ යන්ත්‍ර දෙකක් සහ රු. 249,500 ක් වූ වාහන තුනක් නිශ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතින.

2.4 <u>ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගණුදෙනු</u>

2011 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී වත්කම් වල උප ලේඛන හා භාණ්ඩ සමීක්ෂණ ශේෂයන් සමාන කිරීම සඳහා ජ'නල් සටහන් මඟින් රු. 5,111,597 ක මුදලක් විධිමත් අනුමැතියකින් තොරව ගිණුම්ගත කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේදීද එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.5 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) අනුමත සැලසුම් පරිදි ගොඩනැගිලි ඉදි කර ඇති බව තහවුරු කර ගැනීම සඳහාත් අනවසර ඉදි කිරීම් අවම කර ගැනීම සඳහාත් නැවත පරීක්ෂාවක් සිදු කර නොතිබුණි.

(ආ) 2010 වර්ෂයට ලැබිය යුතු රු. 3,509,416 ක් වූ වැටුප් ප්‍රතිපූර්ණ මුදල් 2012 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) පුද්ගලික සමාගමක් මඟින් ඉඩම් කැබලි කර විකුණනු ලැබූ ටවුන් හුඩ් ව්‍යාපෘතියේ ප්‍රවේශ මාර්ග සංවර්ධනය කර නඩත්තු කිරීම වෙනුවෙන් රු. 2,935,107 ක මුදලක් නගර සභාවට ලබා දීමේ පොරොන්දුව මත කට්ටි සැලසුම් අනුමත කර තිබුණි. ඒ සඳහා 2011 දෙසැම්බර් 20 දින සමාගම මඟින් ලබා දී තිබූ රු. 1,500,000 ක් සභාවේ පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කර තිබුණි. සභාවට ලැබිය යුතු ඉතිරි රු. 1,435,107 ක මුදල ලබා ගැනීමට කටයුතු කර නොතිබූ අතර පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබූ රු. 1,500,000 ක මුදල ව්‍යාපෘතියේ නඩත්තු කටයුතු සඳහා යොදා ගෙන නොතිබුණි.

(ඈ) දේපල ණය පොලී වෙනුවෙන් බැංකුව වෙත ගෙවන ලද රු. 80,716 ක මුදලක් 2013 ජනවාරි 09 වන විටත් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

(ඉ) 2000 වර්ෂයටත් පෙර සිට ශේෂව පැවතෙන විශ්‍රාම ගිය, මියගිය හා සේවය අතහැර ගිය නිලධාරීන් 15 දෙනෙකුට අදාලව අය නොවන සේවක ණය ශේෂය වූ රු. 69,176 ක් අයකර ගැනීමට ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) තොග පාලනය

(ඈ) වත්කම් කලමනාකරණය